**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.12.05 පැය 1725 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2168 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

**2025 / 2026 ශ්‍රී පාද වන්දනා වාරය ආරම්භ කිරීම - පොලිස් මූලස්ථානය.**

2025 / 2026 ශ්‍රී පාද වන්දනා වාරය 2025.12.04 වන දිනට යෙදුණු උදුවප් පුර පසළොස්වක පොහොය දිනයෙන් ආරම්භ වූ අතර වෙසක් පුර පසළොස්වක පොහොයෙන් නිමාවට පත් වේ.

දිවයිනේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයත් සමඟ ඇති වූ මාර්ග අවහිරතා යථා තත්ත්වයට පත් කරමින් ශ්‍රී පාද වන්දනා වාරය සඳහා පැමිණෙන බැතිමතුන් හට ශ්‍රී ලංකා පොලිසිය විසින් විශේෂ ආරක්ෂක හා රථවාහන සැලැස්මක් මෙවරද ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව බැතිමතුන් සඳහා ශ්‍රී පාදස්ථානය වන්දනාමාන කිරීම සඳහා ප්‍රධාන මාර්ග තුනකින් නල්ලතන්නියට ප්‍රවේශ වීමට ඉඩකඩ සැලසෙනු ඇත.

<u>ප්‍රවේශ මාර්ග</u>

- කොළඹ සිට පැමිණෙන බැතිමතුන් යටියන්තොට හරහා ගිනිගත්හේන නගරය පසුකර දියගල මාර්ග බාධකයෙන් දකුණට හැරී නොර්ටන්බ්‍රිජ් නගරය පසු කර මස්කෙළිය මාර්ගයේ පැමිණ මාවුස්සාකැලේ හන්දියෙන් දකුණට හැරී නල්ලතන්නිය දක්වා පැමිණිය හැක.
- ගිනිගත්හේන නගරය ඔස්සේ පැමිණෙන බැතිමතුන් හැටන් නගරය හරහා මස්කෙළිය දක්වා ඇති මාර්ගයේ පැමිණ දකුණට ඇති නොර්ටන්බ්‍රිජ් මාර්ගයේ ගමන් කර මාවුස්සාකැලේ හන්දියෙන් වමට හැරී නල්ලතන්නිය දක්වා පැමිණිය හැක.
- බලංගොඩ දෙස සිට පැමිණෙන බැතිමතුන් පින්නවල, මාරතැන්න, බගවන්තලාව හරහා මස්කෙළිය මාර්ගයේ ගමන් කර මස්කෙළිය ඉන්ධන හල අසලින් දකුණට ගොස් මාවුස්සාකැලේ හන්දියෙන් වමට හැරී නල්ලතන්නියට පැමිණිය හැක.

ශ්‍රී පාද වන්දනාව සඳහා පැමිණෙන බැතිමතුන්ගේ රථවාහන ගාල් කිරීම සඳහා පෙර පැවති විජිත රථගාල 01 (තොණ්ඩමන් රථගාල) හා විජිත රථගාල (පොලිසිය අසල ඇති) පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක නොවන අතර රථවාහන ගාල් කිරීම සඳහා නල්ලතන්නිය නගරයේ ඇති ප්‍රාදේශීය සභා රථගාල සහ නල්ලතන්නිය සිට හැටන් දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ දකුණු පස ප්‍රදේශය වෙන් කර ඇත.

එසේම බැතිමතුන්ගේ ගමන් පහසුව සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ හා පුද්ගලික බස් රථ හැටන් නගරයේ සිට නල්ලතන්නිය දක්වා ධාවනයේ යෙදවීමට කටයුතු කර ඇත.

ශ්‍රී පාද වන්දනාවේදී මත්ද්‍රව්‍ය, මත්පැන් හෝ දුම්වැටි රැගෙන ඒම, විකිණීම, මිලදී ගැනීම හෝ භාවිතා කිරීමෙන් වළකින ලෙසත්, වන්දනා මාර්ගයේ හෝ සිරිපා මළුව පරිශ්‍රයේ, විශ්‍රාම ශාලා අවට පරිසරයේ පොලිතින්, ප්ලාස්ටික් සහ කැලිකසළ අවිධිමත් ලෙස බැහැර නොකරන ලෙසට බැතිමතුන්ගෙන් හා මහජනතාවගෙන් ශ්‍රී ලංකා පොලිසිය ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**